ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

මහජන ආරක්ෂක අමාත්‍යාංශය

# ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

# ලංසු සඳහා ආරාධනයයි

## ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත ඩෙස්ක්ටොප් පරිගණක යන්ත්‍ර 100 ක් සැපයීම ගෙනැවිත් භාරදීම හා ස්ථාපනය සඳහා වන ප්‍රසම්පාදනය

IFB අංකය : DIE/PRO/04/2023/22

01. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත ඩෙස්ක්ටොප් පරිගණක යන්ත්‍ර 100 ක් සැපයීම, ගෙනැවිත් භාරදීම හා ස්ථාපනය සඳහා වන ප්‍රසම්පාදනය සඳහා යෝග්‍යතාපූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

02. ජාතික තරගකාරී ලංසුකරණ පරිපාටිය මගින් ලංසු මෙහෙයවනු ලැබේ.

03. ආපසු ගෙවනු නොලබන රුපියල් අට දහසක (ලංකා රු. 8,000/-) ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2023-07-11 වෙනි දින සිට 2023-08-02 වෙනි දින දක්වා රාජකාරී දිනයන්හි පෙ.ව. 9.00 හා ප.ව. 3.00 අතර බත්තරමුල්ල, ශ්‍රී සුභූතිපුර පාර, "සුහුරුපාය", 5 වන මහලේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන අංශයේ නියෝජ්‍ය පාලක (ප්‍රසම්පාදන) වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය. ගෙවීම් ක්‍රමය මුදලිනි.

04. මේ සඳහා උනන්දුවක් දක්වන යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් වැඩිදුර තොරතුරු රාජකාරී දිනයන්හි පෙ.ව. 9.00 හා ප.ව. 3.00 අතර දුරකථන අංක 0112-101559 ඔස්සේ ලබා ගත හැකිය. ඉහත 3 වන ඡේදයේ සඳහන් ලිපිනයේදී 2023-07-11 වෙනි දින සිට 2023-08-02 වෙනි දින දක්වා ලංසු ලිපිලේඛන නොමිලේ පරීක්ෂා කර බැලිය හැකි අතර www.immigration.gov.lk යන දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙන්ද ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැකිය.

05. "මුල් පිටපත" හා "අනු පිටපත" ලෙස සකස් කර නිසි ලෙස සම්පූර්ණ කරන ලද ලංසු, වෙන් වෙන් වශයෙන් කවර දෙකක බහා, එම කවර දෙක නැවත තනි කවරයක බහා එහි වම් පස ඉහළ කෙළවරේ කොන්ත්‍රාත්තුවේ නම සහ IFB අංකය පැහැදිලිව සඳහන් කර මුද්‍රා තබා 2023-08-03 වෙනි දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් එවීමට හෝ 3 වන ඡේදයේ සඳහන් ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හැකිය. ලංසු භාරගැනීම සඳහා වන අවසාන දිනයේ සිට හෝ ගැණුම්කරු විසින් දීර්ඝ කරනු ලබන දිනයේ සිට දින හැත්තෑ හතක් (77) ලංසු වලංගු විය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,**
**05 වන මහල,**
**"සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල.**

06. පූර්ව ලංසු රැස්වීමක් 2023-07-19 වෙනි දින පෙ.ව. 10.00 ට බත්තරමුල්ල, ශ්‍රී සුභූතිපුර පාර, "සුහුරුපාය", 5 වන මහලේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේදී පැවැත්වේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,**
**"සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල.**